# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2195/34 - 2020 සැප්තැම්බර් මස 30 වැනි බදාදා - 2020.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාත් සභාව

ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමා විසින්, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිණී ආර්. එම්. එස්. ඩී. රත්නායක මහත්මිය තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.05.06 දින සිට) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

02. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ නිලධාරිණී එම්. පී. එස්. කරුණාරත්න මහත්මිය 2020.05.24 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි, ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි එච්. එම්. ජේ. හේරත් මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව 2020.05.29 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ඌව පළාත් සභාවේ සභා ලේකම් තනතුරේ වැඩ බැලීමට.

04. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිණී ආර්. එම්. එස්. ඩී. රත්නායක මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි (2020.06.01 දින සිට) ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, වතුයටිතල පහසුකම්. සමුපකාර හා ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසැල් හැර) පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

05. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිණී ඩී. ජී. සී. ජයතුංග මහත්මිය, 2020.06.11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වශයෙන්.

06. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි එම්. එම්. විජේනායක මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.06.11 දින සිට) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) තනතුරේ වැඩ බැලීමට.


1A - PG 005147 — 70 (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

07. දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි ආර්. එම්. එස්. එල්. බී. රත්නායක මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව වහාම ක්‍රියාත්මක වන පරිදි (2020.07.06 දින සිට) ඌව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ඉටුකිරීමට.

08. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරිණී එල්. එච්. පී නිල්මිණී මහත්මිය 2020.05.12 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි බදුල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට,

09 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි ඩබ්ලිව්. රත්දෙණිය මහතා, 2019.02.26 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් වශයෙන්.

10. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරිණී වෛද්‍ය පී. ජී. ඩී. එස්. ප්‍රේමතිලක මහත්මිය, 2020.08.24 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි, ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරි එස්. පී. අතුකෝරල මහතා, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.08.21 දින සිට) ඌව පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි දයානන්ද රත්නායක මහතා, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.08.25 දින සිට) ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු හා සමාජ සුභසාධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

13. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිණී ඩී. ජී. සී. ජයතුංග මහත්මිය, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.08.25 දින සිට) ඌව පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

14. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි ඩබ්ලිව්. රත්දෙණිය මහතා, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.08.25 දින සිට) තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන (ළවිඩ පාසැල් හැර), පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ වැඩ බැලීමට.

15. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරි එන්. එම්. එස්. පී. කේ. නිශ්ශංක මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2020.08.25 දින සිට), තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තනතුරේ රාජකාරි ඉටුකිරීමට.

16. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරිණී ජී. ඩබ්. සී. එස්. ප්‍රියභාෂිණී මහත්මිය, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.08.25 දින සිට) ඌව පළාත් ඉඩම් කොමසාරිස් තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

17. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරි සී. අද්දරවත්ත මහතා, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.08.25 දින සිට) තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාත් සමුපකාර කොමසාරිස් තනතුරේ රාජකාරි ඉටුකිරීමට.

18. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිණී ආර්. එච්. සී. ප්‍රියන්ති මහත්මිය, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.08.25 දින සිට) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

19. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිණී ආර්. එච්. සී. ප්‍රියන්ති මහත්මිය, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.08.25 දින සිට) නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

**ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල,**
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් (වැ.බ).

2020 අගෝස්තු මස 26 වැනි දින
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

10 - 641

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.